**ශීර්ෂය -123- නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 නොවැම්බර් **08** දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**1.6.1** මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින්**,** වෙනත් මූලධන වියදම් යටතේ ඇති යටිතල පහසුකම් සංවර්ධන වැය විෂයය **(2506)** මගින් **2021** වර්ෂය තුළ රු.15,718,376,572 ක් සංවර්ධන කටයුතු සඳහා වැයකර තිබුණි. නමුත් එම වියදම දැරීම තුලින් පැන නැගුණු වත්කම් හෝ කෙරීගෙන යන වැඩ පිලිබදව ගිණුම් ප්‍රකාශන තුල හෙළිදරව් වී නොතිබුණි. | මහාභාණ්ඩාගාරය විසින් හදුන්වා දී ඇති ගිණුම්කරන පද්ධතිය තුලින්**,** මේ පිලිබදව හෙළිදරවු කිරීමේ පහසුකම සපයා නොමැත. | ප්‍රාග්ධන වියදම් දැරීම තුලින් පැන නැගුණු වත්කම් හෝ කෙරීගෙන යන වැඩ පිලිබදව හදුනාගැනීම සඳහා ක්‍රමවේදයක් හදුනාගත යුතුය. |
| (ආ) | අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට වූ වාහන ලැයිස්තුව අනුව අයිතිය අමාත්‍යාංශය සතු වාහන 10 ක් පැවති අතර ඒවායෙහි තක්සේරු වටිනාකම රු.94,325,880 ක් විය. නමුත් 2021 දෙසැම්බර් 31 දිනට වූ වාර්ෂික ගිණුම් ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබූ වාහන වල අගය රු.47,595,880 ක් ලෙස එනම් රු.46,730,000 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | එකගවෙමි. 2022 අප්‍රේල් ගිණුම් සාරාංශ මගින් නිවරදි කර ඇත. | අමාත්‍යාංශය සතු වත්කම් පිලිබද නිවැරදි තොරතුරු වාර්ෂික ගිණුම් ප්‍රකාශන මගින් හෙළිදරවු කල යුතුය |

## (ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි **454(1)** ප්‍රකාරව, අමාත්‍යාංශය යටතේ පවතින කාර්යාල 11ක බඩුවට්ටෝරු ලේඛන සහ පාරිභෝජන ද්‍රව්‍ය ලේඛන පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු දීමට කල් ඉල්ලා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොත් හා පාරිභෝජන ද්‍රව්‍ය ලේඛන පවත්වාගත යුතුය |
| (ii) | මුදල් රෙගුලාසි **214** ප්‍රකාරව අමාත්‍යාංශය විසින් බැරකම් ලේඛනයක් පවත්වා තිබුණද සංවර්ධන වැඩසටහනෙහි බැරකම් පිළිබඳ විස්තර ඇතුලත් කර එම ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | එකග වෙමි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව සියළු බැරකම් ඇතුලත් බැරකම් ලේඛනයක් පවත්වාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ප්‍රකාරව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලේඛනයක් අමාත්‍යාංශය විසින් නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කර ගෙන යනු ලැබේ. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සටහන් කිරීම සඳහා ලේඛනයක් පවත්වාගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයන් 04 ක එකතුව රු.151,500,000 ක ප්‍රතිපාදන සහ ප්‍රාග්ධන වැයවිෂයන් 4 ක එකතුව රු.1,800,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් (100%)ක් ඉතිරිවී තිබුණි. | එකග වෙමි | මුදල් රෙගුලාසි **50 (ii)** ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන්, නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීමවේ. |
| (ආ) | අංක 123-02-07-08-2506-17 දරණ වැය විෂයය සඳහා වෙන්කල රු.925,000,000 ක මුදල වැය විෂය අංක 123-02-07-19-2506-17 දරණ වැයවිෂයයට මු.රෙ 66 යටතේ මාරුකර ඇතත් එම සම්පූර්ණ මුදලම උපයෝජනය කර නොතිබුණි. | එකග වෙමි. | - එම - |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයන් 27 ක් යටතේ ප්‍රතිපාදිත රු.166,076,000 ක සහ ප්‍රාග්ධන වැය විෂයයන් 09 ක් යටතේ ප්‍රතිපාදිත රු.16,116,332,328 ක මුදලින්, එක් එක් වැය විෂයයේ ප්‍රතිපාදන වලින් 20% - 88% අතර පරාසයක වන ලෙස පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් රු. 68,814,855ක් හා ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් රු.6,486,137,796 ක් වන ලෙස එකතුව රු. 6,554,952,651ක් ඉතිරි වී තිබුණි. | එකග වෙමි. | - එම - |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් වැයවිෂයයන් 02 ක් වෙනුවෙන් සලසා තිබුණු රු. 955,000,000 ක ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.24,161,225 ක බැරකම්වලට එළඹ තිබුණි. | මෙය සෑම වර්ෂයකම සිදුවන සාමාන්‍ය ක්‍රියාවලියකි. | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ 2 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | අමාත්‍යාංශයේ බැරකම් ලේඛනය අනුව වැය විෂය අංක 123-02-07-29-2506(11) (නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය) සඳහා රු.1,177,472,025 ක බැරකමක් සටහන්කර තිබුණද අදාල බැරකම අවසන් ගිණුම් කට්ටලයේ සටහන **III** යටතේ සටහන්කර නොතිබුණි. | එකග වෙමි | වර්ෂය තුල එළැඹි සියළු බැරකම් විස්තර හෙලිදරවු කල යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.101 (1)සහ 104 (4) ඡේද | අලාභ හානිය සිදුවී තුන්මසක් ඇතුලත පූර්ණ පරීක්‍ෂාවක් කර, අලාභ හානියේ වටිනාකම වන 6,390,000 ක මුදල සහ වගකිව යුත්තන් නිෂ්චය කර අලාභහානිය පූරණය කර ගැනීමට කටයුතු කලයුතු විය. එහෙත් අංක PH 0894 දරණ වාහනය 2020 සැප්තැම්බර් 06 දින අනතුරට ලක්වීමෙන් පූර්ණ හානිවී තිබූ නමුත් එම හානිය පූරණය කර ගැනීමට නොහැකි වී තිබුණු අතර අනතුර සිදුවී වසර 1 ½ ක් ගත වුවද මු.රෙ. ප්‍රකාරව අවසන් පරීක්ෂණ වාර්තාවද ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර පූර්ණ පරීක්‍ෂණ වාර්තාව ලැබුණු පසු එම නිර්දේශ අනුව කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ ජල ද්‍රෝනියේ පෝෂක ප්‍රදේශයේ ජල ගැලීම් අඩු කිරීම, කොළඹ අගනගර ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම, කොළඹ නගරය අලංකාර කිරීම අරමුණු කරගෙන කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය **2017** ජූනි **30** දින අවසන් කිරීමට යෝජිතව **2012** ජූලි **10** දින ආරම්භ කර තිබුණු අතර **2022** ජූනි **30** දින දක්වා දින දීර්ඝ කර තිබුණි . ව්‍යාපෘතිය සඳහා ණය දෙන නියෝජිතායතනය විසින් ලබා දීමට නියමිත වූ ඩොලර් මිලියන **213** ට සමාන රුපියල් මිලියන **27,890.22** ක මුළු මුදලින් සියයට **90** ක් නියෝජනය කරන ඇ.ඩො. මිලියන **191.68** ක් එනම් රුපියල් මිලියන **31,079** ක් සහ රජයේ ප්‍රතිපාදන යටතේ ප්‍රතිපාදිත රුපියල් මිලියන **14,141.52** ක් වූ මුළු ප්‍රතිපාදනවලින් සියයට **60.8** ක් නියෝජනය කරන ඇ.ඩො.මිලියන **69.2** කට සමාන රුපියල් මිලියන **8,368** ක් පමණක් **2021** දෙසැම්බර් **31** දින වන විට උපයෝජනය කර තිබුණි . | එකඟ වේ. | ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදිත මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කල යුතුය. |
| | තවද, 2013 දෙසැම්බර් මාසයේදී රුපියල් මිලියන 27.22 ක වියදමින් බම්බලපිටියේ සහ කොල්ලුපිටියේ පදික උඩිස් පාලම් **(pedestrian overhead bridge)** සැලසුම් කිරීම සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශන සේවා කොන්ත්‍රාත්තු **02** ක් රුපියල් මිලියන **27.22** ක වටිනාකමකට **2013** දෙසැම්බර් මාසයේදී උපදේශන සමාගමකට ලබා දී තිබුණි. එය සති **10** ක් ඇතුළත අවසන් කිරීමට එකඟ වී තිබුණ ද ව්‍යාපෘතිය විසින් එම කටයුතු නතර කරන ලෙස **2016** මැයි **23** දින උපදේශන සමාගමට දන්වා තිබුණි. එම දැන්වීම උපදේශකවරයාට නියමිත වේලාවට දැනුම් නොදීම හේතුවෙන් බේරුම්කරණ විනිශ්චය මණ්ඩලයේ උපදෙස් මත උපදේශන ගාස්තු වශයෙන් රුපියල් මිලියන **21.79** ක මුදලක් අදාල උපදේශන සමාගමට ගෙවීමට සිදු වී තිබුණු අතර එය අනාර්ථික වියදමක් වී තිබුණි. | අතිරේක ගෙවීම් ද ඇතුළු සියලුම කාර්යයන් සඳහා උපදේශන ගාස්තු ඉල්ලා තිබුණි. බේරුම්කරණ තීරණය අනුව ගෙවීමට සිදු විය. | |

| | | | |
|---|---|---|---|
| (ආ) | ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් වෙන්කරන ලද රු.මිලියන 1,064.79 කට සමාන එ.ජ.ඩො. මිලියන 5.27 ක මුළු අරමුදල්වලින් නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය මාස 36 කින් අවසන් කල යුතු විය. ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කල දින සිට මාස 33 ක් ඉකුත් වූ පසු එනම්, 2021 දෙසැම්බර් 31 දිනට මුළු වෙන් කිරීමෙන් සියයට 38 ක් නියෝජනය වන රු.මිලියන 406.27 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.07 ක් පමණක් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි. | එකඟ වේ. කෝවිඩ් වසංගතය හේතුවෙන් ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු නතර කිරීමට සිදුවීම, ප්‍රධාන හේතුව විය. | ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදිත මුදල් උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව උපයෝජනය කල යුතු බව. |
| (ඇ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ **2020** අගොස්තු **18** දිනැති හා අංක **ER/AB/US/01(vol-i)** දරණ ලිපිය අනුව, ඉහත ව්‍යාපෘතිය විසින් උප ව්‍යාපෘති **3** ක්, **2020** ඔක්තෝබර් **12** දින සිට අත්හිටුවා තිබුණි. එදින දක්වා එම ව්‍යාපෘති සඳහා රු. මිලියන **413.36** ක මුදලක් වැයකර තිබුණු අතර **2022** ජුනි **20** දින වන විටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම මත දරන ලද උක්ත වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | ව්‍යාපෘතිය නැවත සක්‍රිය කර ඇති බැවින් කළින් උපදේශකයන් විසින් දැනටමත් සිදුකර ඇති කාර්යයන් ප්‍රයෝජනයට ගෙන නව සැලැස්ම සමඟ ඉදිරියට යාමට තීරණය විය. | උප ව්‍යාපෘති වහා ක්‍රියාත්මක කිරීමට නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| (ඇ) | **2019** ජූලි **22** වැනි දින ආරම්භ කර **2023** ජූනි **30** වන විට අවසන් කිරීමට නියමිතව තිබූ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය සඳහා එකඟ වූ ණය මුදල එ.ජ.ඩොලර් මිලියන **200** ක් විය. **2021** දෙසැම්බර් **31** වන විට එයින් එ.ජ.ඩොලර් මිලියන **16.87**ක් පමණක් වැයකර තිබුණි. ණය ගිවිසුමට අනුව, භාවිතා නොකල ණය මුදල මත ව්‍යාපෘතිය විසින් ණය දෙන බැංකුවට සියයට **0.25** ක වාර්ෂික කැපවීමේ ගාස්තුවක් ගෙවිය යුතු විය. දුර්වල කාර්ය සාධනය හේතුවෙන් **2021** දෙසැම්බර් **31** දිනට ව්‍යාපෘතිය සඳහා කැපවීමේ ගාස්තු ලෙස ඩොලර් මිලියන **0.461**ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ ප්‍රගතිය අනුව ණය මුදල වාරික වශයෙන් මුදාහරින බැවින් වසර අවසානයේ නිදහස් නොකළ ණය මුදල සඳහා කැපවීම් ගාස්තු ගෙවීමට සිදුවීම වැළැක්විය නොහැක. | ව්‍යාපෘතියේ කටයුතු නියමිත කාලය තුළ සිදු කර රටට සිදුවන පාඩුව අවම කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඉ) | ඉහත සඳහන් සමස්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, 2021 වසර තුළදී අක්කර 37.5 ක ඉඩම් කට්ටි 04 ක් සංවර්ධනය කිරීමට නියමිතව පැවතියද එම කාර්යභාරය සිදුකර නොතිබුණි. | උපදේශකයෙකුගේ සේවය ලබා ගැනීම සඳහා සකස් කරන ලද **TOR** සඳහා අමාත්‍යාංශයේ නිර්දේශය සහ **AIIB** බැංකුවේ අනුමැතිය | ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වලට අනුව ඉඩම් සංවර්ධන කටයුතු සිදු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | | ලැබිය යුතුය. |
| (ඊ) | **2020** අප්‍රේල් **20** වන දින ආරම්භ කරන ලද කොන්ත්‍රාත් වටිනාකම රු**. 1,723,347,855** ක් වූ ඔබේසේකරපුර නිවාස ව්‍යාපෘතියේ නිවාස ඉදිකිරීම් කටයුතු **2022** ඔක්තෝබර් **21** දිනට නිම කිරීමට නියමිතව තිබුණි**.** නමුත් කොන්ත්‍රාත් ගිවිසුමේ 15.2.2 වගන්තියට අනුව**,** 2022 මාර්තු **29** වැනි දින අමාත්‍යාංශය විසින් කාර්යසාධනය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණි**.** එසේ වුවද එම කොන්ත්‍රාත්කරු වෙත ලබාදී තිබුණු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් රු**.** 172,334,785 ක් 202**2** ඔක්තෝබර් **06** දින දක්වාත් අයකරගෙන නොතිබුණි**.** | අත්තිකාරම් ඇපකර මුදල් අය කිරීමට කටයුතු ආරම්භ කර ඇත. කොන්ත්‍රාත්තුව නැවත ප්‍රදානය කිරීම ද සිදු වෙමින් පවතී. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හැකි ඉක්මනින් අයකර ගැනීම සඳහා කටයුතු කල යුතු බව. |
| (උ) | ව්‍යාපෘතියේ තාක්ෂණික අංශය විසින් කරන ලද කාර්ය සාධන වාර්තාවට අනුව, ඇපල්වත්ත නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතියේ නිවාස ඒකක **700** ක් ඉදිකිරීම සඳහා **2020** දෙසැම්බර් **31** වන දින රුපියල් මිලියන **3,890.00** කට කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙන තිබූ නමුත් **, 2021** ජනවාරි **26** වන දින දක්වා ව්‍යාපෘතිය සඳහා උපදේශකයින් තෝරාගෙන නොතිබුණි**.** එහි ප්‍රතිඵලයක් ලෙස, උපදේශකවරුන්ගේ අධීක්ෂණයකින් තොරව ඉදිකිරීම් වල මූලික වැදගත් කාර්යයන් සිදු කර තිබූ බව උපදේශකවරුන් විසින් හෙළිදරව් කර ගෙන තිබුණි**.** ඒ අනුව සම්පූර්ණ කරන ලද කාර්යයන් නැවත නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවී තිබුණි. මේ හේතුවෙන් **2021** දෙසැම්බර් **31** දිනට සැලසුම් කළ සියයට **35** ක ප්‍රගතියට සාපේක්ෂව ඉදිකිරීම් කටයුතුවල කාර්ය සාධනයේ සත්‍ය ප්‍රගතිය සියයට 22 ක් පමණක් වී තිබුණි. | නිවැරදි කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව නිසි පියවර ගත යුතු බව. |
| (ඌ) | ඉහත ව්‍යාපෘතියේ නිවාස ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී එක් ලංසුකරුවෙකු විසින් ලබාදුන් රුපියල් **43,253,577** ක මුදල් වට්ටම ලංසු විවෘතකිරීමේ කමිටුව විසින් හා ඇගයීම් කමිටුව විසින් සැලකිල්ලට නොගෙන වඩා ඉහල ලංසුවක් ඉදිරිපත් කළ ලංසුකරුවෙකුට ලංසුව පිරිනමා තිබුණි. පිරිනමන ලද කොන්ත්‍රාත් මිල හා වට්ටම් අඩුකල මිල අතර රුපියල් **10,931,910** ක වෙනසක් නිරීක්ෂණය විය**.** ලංසු විවෘත කිරීමේ කමිටුව මේ පිළිබඳ අවධානය යොමු නොකිරීමට හේතු විමර්ශනය කර නොතිබුණි. | ලංසු විවෘතකිරීමේ කමිටුව විසින් එක් ලංසුකරුවෙකු විසින් පිරිනමනු ලැබූ වට්ටම් සලකා බලා නැත. ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයෙන් සහ **AIIB** බැංකුවෙන් උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි ඇතුළත් විධිවිධාන අනුගමනය කළ යුතු බව**.** |

| | | | |
|---|---|---|---|
| (එ) | ෆර්ගියුසන් නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතියේ නිවාස ඉදිකිරීම් ප්‍රසම්පාදන කාල සටහනට අනුව, ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු **2019** අප්‍රේල් **21** දින ආරම්භ කර **2019** අගෝස්තු **15** දින එනම් මාස **4**ක් ඇතුළත අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. එහෙත් ලංසුව පිරිනැමීමට ලංසුව කැඳවා මාස **21**ක කාලයක් ගතකර තිබුණි. තවද ඉදිකිරීම් කටයුතු පිරිනමන ලද සමාගම ලෝක බැංකුව විසින් **2019** ජූනි **05** සිට **2020** මාර්තු දක්වා මාස **09**ක කාලයක් සඳහා තහනමට ලක් කරන ලද ආයතනයක් වූ අතර එම තහනම් කාලසීමාව තුල එම සමාගම ලියාපදිංචියකින් තොරව තවත් චීන සමාගමක් සමග නව හවුල් ව්‍යාපාර සමාගමක් පිහිටුවා මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලංසු ඉදිරිපත් කර තිබුණි. නමුත් ලියාපදිංචිය සැලකිල්ලට නොගෙන කොන්ත්‍රාත්තුව අදාල සමාගමට පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් අනතුරුව අදාල සමාගම නීත්‍යානුකූල සමාගමක් බවට ලියාපදිංචි කර ගැනීමට සිදුවීම නිසා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාද වීම සහ අත්තිකාරම් ඇපකරය ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම හේතුවෙන්, **2021** දෙසැම්බර් **31** දිනට ඉලක්කගත මූල්‍ය හා භෞතික කාර්ය සාධනය වන පිලිවෙලින් රු. මිලියන **400** ක් සහ සියයට **12.2** වෙත ලගාවිය නොහැකි වී තිබුණු අතර මූල්‍ය හා භෞතික කාර්ය සාධනය පිළිවෙලින් සියයට **0** සහ සියයට **6.5** ක් පමණක් වී තිබුණි. | 2019 ඔක්තෝබර් 03 දින පැවති SCAPC රැස්වීමේ වාර්තාවට අනුව, ෆර්ගියුසන් පාරේ නිවාස ව්‍යාපෘතිය සඳහා සංශෝධිත ප්‍රසම්පාදන කාලසටහන ඉදිරිපත් කරන ලෙස ප්‍රසම්පාදන ආයතනයට පැහැදිලිව උපදෙස් දී ඇත. රට තුළ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් අමුද්‍රව්‍ය සහ ශ්‍රමය ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් මෙම පසුබෑසීම සිදුවී ඇත. | ප්‍රසම්පාදන කාල සටහනට අනුව කටයුතු කල යුතු බව. |
| (ඒ) | ඉහත ව්‍යාපෘතියේ නිවාස ව්‍යාපෘති **03** ක් සඳහා පරිසර උපදේශක කමිටු අවසරය, නිවාස ව්‍යාපෘති **05**ක් සඳහා සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙන් ලබා ගතයුතු (CMA) සහාධිපත්‍ය කළමනාකරණ අවසරය සහ නිවාස ව්‍යාපෘති **04**ක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගත යුතු ගොඩනැගිලි අවසරය **2022** අගෝස්තු **30** දින දක්වා ලැබී නොතිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, විවිධ රාජ්‍ය ආයතනවලින් ලබා ගත යුතු බලපත්‍ර අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් ලබා ගත යුතුය. | අදාල අනුමැතීන් කඩිනමින් ලබා ගැනීමට කටයුතු කල යුතු බව. |
| (ඔ) | **2014** මැයි **05** දින ආරම්භ කර **2019** දෙසැම්බර් **31** දින එනම් වර්ෂ 5 ½ කින් පමණ අවසන් කිරීමට යෝජිතවූ උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය මෙම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කල දින සිට වරශ **7 ½** කින් පසු වුවද එනම් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද නියෝජිතායතනය විසින් සපයන ලද රු.මිලියන 30,300 ක් වූ මුළු අරමුදලින් සියයට **65.6** ක් එනම් ඇමරිකානු ඩොලර් | එකඟයි. පවතින තත්ත්වයන් අරමුදල් භාවිතය අඩු වීමට හේතු වී ඇත. | ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදිත මුදල් උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව උපයෝජනය කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | මිලියන **72.14** ක මුදලක් පමණක් භාවිතා කර තිබුණි**.** තවද අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි වීම හේතුවෙන් මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය **(KMTT)** ඉදිකිරීම සඳහා වෙන් කර ඇති එ.ජ. ඩොලර් මිලියන **65** ක් සහ එ.ජ. ඩොලර් මිලියන **27** ක් ඇතුළත් එ.ජ. ඩොලර් මිලියන **92** ක් **2021** දෙසැම්බර් **31** දිනට අවලංගු කර තිබුණි**.** ඒ අනුව ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී ඇති බව විගණනයේදී අනාවරණය විය**.** | | |
| **(ඕ)** | ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ මහනුවර ධර්මාශෝක මාවතේ කිලෝමීටර් **3.39** ක් ප්‍රතිසංස්කරණය කර වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව **2016** ජූලි **07** දින රුපියල් මිලියන **796.4** කට ප්‍රදානය කර තිබුණි. එම කොන්ත්‍රාත්තුව **2018** ජූලි **07** දින අවසන් කළ යුතුව තිබුණද **2019** ජුනි **14** වන දින අතරමග නතර කර තිබුණි**.** තව ද**,** එතෙක් නිම කරන ලද ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් මිලියන **405.7** ක මුදලක් ගෙවා තිබුණි**.** ඉතිරි ඉදිකිරීම් කටයුතු පිළිවෙලින් රු**.**මිලියන **355.5**7 ක සහ රු**.** මිලියන **156.6**2 ක මුදලකට වෙනත් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වෙත පිරිනමා තිබිණි**.** ඒ අනුව**,** මෙම ක්‍රියාකාරකමේ අවසාන සම්පූර්ණ වටිනාකම රු**.** මිලියන **917.93** ක් විය**.** එහෙයින්**,** කොන්ත්‍රාත්තුව අතරමඟ අත්හැරීම හේතුවෙන් ව්‍යාපෘතියට අමතරව රු**.** මිලියන **121.5** ක වියදමක් දැරීමට සිදු වී තිබුණි. | එකගවේ. | ව්‍යාපෘතියේ සමස්ත භෞතික සැලැස්ම අනුව ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ස්ථාවර සහ ඵලදායී කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතු බව. |
| | ඉහත ව්‍යාපෘතිය යටතේ ගාල්ල මොරගොඩ ප්‍රධාන ඇළ මීටර් **4250** ක් දීර්ඝකිරීම සහ පන්සල් අතුරු ඇල ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව **2017** මාර්තු **06** දින ලබා දී තිබුණි. එහි වටිනාකම රු**.** මිලියන **844.9** ක් විය**.** මෙය **2019** සැප්තැම්බර් **07** දින නිම කිරීමට සැලසුම් කර තිබුණද **2019** අප්‍රේල් **11** වැනි දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි**.** ව්‍යාපෘතියේ සම්පූර්ණ කාලසීමාව දින **900** ක් සඳහා ඉලක්ක කලද දින **780** ක් තුල නිම කල වැඩ ප්‍රමාණය **20%**ක් විය. ඒ සඳහා රු**.**මිලියන **329.1** ක් ගෙවා තිබුණි. ඇලෙහි වැඩ නිම නොකල ඉතිරි කොටසින් මීටර් **1,850** ක් පමණක් | එකගවේ. | ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන **462.62** ක් ඇතුලුව මුලු වියදම රු. මිලියන **736.03** ක් විය. ඒ අනුව කොන්ත්‍රාත් වැඩ අසම්පූර්ණ වීම නිසා එහි සම්පූර්ණ ප්‍රතිලාභ මහජනතාවට ලබා ගැනීමට නොහැකි වී තිබුනි. නමුත් ප්‍රධාන ඇළේ සම්පූර්ණ දිග සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දරණ ලද පිරිවැය රු. මිලියන **397.6**ක් විය. | | |
| (ක) | ගාල්ල මහ නගර සභාවේ ගබඩාව සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2019 අප්‍රේල් 24 වන දින රුපියල් මිලියන 135.65 කට ලබා දී තිබුණි. ඉදිකිරීම් කාලය දින 270 ක් වූ අතර තවත් දින 113ක කල් දිගුවක් ලබා දී තිබුණද 2022 මැයි 23 දින කොන්ත්‍රාත්තුව අවසන් කරන විට ඒහි භෞතික ප්‍රගතිය **90%** ක් පමණක් විය. | එකඟ විය. | ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්යක්ෂම සහ ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් යටතේ ක්‍රියාත්මක කළ යුතු බව. |
| (ග) | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, රුපියල් මිලියන 6,562.68 ක් වටිනා පැකේජ 12ක ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2021 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. නමුත් උපදේශන කාර්යයේ සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් ප්‍රමාද වීම හේතුවෙන් රුපියල් මිලියන 5,925.19 ක් වටිනා පැකේජ 08 ක ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක නොවිණි. එබැවින්, ණය පහසුකම 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කිරීමට සිදු විය. | එකගවේ. | ව්‍යාපෘති අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතු බව. |
| (ච) | ඉහත ව්‍යාපෘතියේ අනුරාධපුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2021 නොවැම්බර් 03 දිනැති ඉංජිනේරු ඇස්තමේන්තුව රුපියල් මිලියන **920.44** ක් වූ අතර ඒ සඳහා කොන්ත්‍රාත්කරු විසින් 2021 ඔක්තෝම්බර් 29 දින ඉදිරිපත් කරන ලද වටිනාකම රුපියල් මිලියන **1,176.12** ක් විය. එය ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා **30.2%** වැඩි විය. ඉංජිනේරු ඇස්තමේන්තුව සහ කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණපත්‍ර සමග රේට විශ්ලේෂණය සිදුකර නොතිබුණි. තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාණපත්‍ර ඍණ වටිනාකම් පරාසය **1 - 93%** තුලද ප්‍රමාණපත්‍ර රේට වැඩි වටිනකම් පරාසය **1 - 4483%** අතර විය. | එකඟවේ. උපදේශන ආයතනය විසින් සකස් කරන ලද ඇස්තමේන්තුව සංශෝධනය කරන ලෙස පසුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් ඉල්ලා සිටින ලදී. එම සංශෝධිත ඇස්තමේන්තුව 2021/12/17 රුපියල් මිලියන 1,110.51 කි. එවිට වටිනාකම වෙනස් වූයේ 6.2% ක් පමණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු බව. |
| (ජ) | තවද ඉහත ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුමට අනුව ව්‍යාපෘතිය මගින් රුපියල් මිලියන 6,562.68 ක පැකේජ 12 ක ප්‍රසම්පාදන | එකගවේ. | ව්‍යාපෘති අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාවලිය 2021 වසර අවසන් වන විට අවසන් කිරීමට නියමිතව තිබූ නමුත් උපදේශකයින්ගේ විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් වල ප්‍රමාදය හේතුවෙන් රුපියල් මිලියන 5,925.19 ක් වටිනා පැකේජ 08 ක ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක නොවීය. එබැවින්, ණය පහසුකම 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කිරීමට සිදු විය. | | කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතු බව. |
| (ට) | මීට අමතරව ඉහත ව්‍යාපෘතිය සවිස්තරාත්මක සැලසුම් අධ්‍යයන උපදේශන සේවා ප්‍රසම්පාදනය සඳහා රුපියල් මිලියන 212.66 (යුරෝ මිලියන 1.18) සඳහා 2017 අගෝස්තු 29 වැනි දින **SCE, Group hit – Green Tech Consultants** හවුල් ව්‍යාපාරය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව, සමාගම විසින් 2019 මැයි 12 වන දින සම්පූර්ණ උපදේශන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. නමුත් එදිනට ඒය ඉදිරිපත් කර නොතිබූ අතර ඉන් පසු සිව් වතාවක් දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව යටතේ, වාර්තා 18 ක් නියමිත දිනවල දී ඉදිරිපත් කිරීමට එකග වී තිබූ අතර නියමිත දිනට වාර්තා 17 ක් ම ඉදිරිපත් කර නොතිබුණි. එබැවින්, ගිවිසුමේ **46.2** වගන්තියට අනුව, අය කළ යුතු ප්‍රමාද ගාස්තුව රුපියල් **59,301,465** ක් එම ආයතනයෙන් අයකරගත යුතු නමුත් **2021** දෙසැම්බර් **31** වන දින දක්වාම අය කර ගෙන නොතිබුණි. | එකගවේ. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මනා සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතු බව. |
| (ඩ) | ඉහත අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ අපජල කළමනාකරණ සංරචකය සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා **04** ක් ඉදිරිපත් කිරීම සඳහා අමතර උපදේශණ කාර්යයක් 2018 අප්‍රේල් මාසයේදී ලබා දී තිබුණි. මේ නිසා කොන්ත්‍රාත්තුවේ වටිනාකම (යුරෝ **106,080** සහ ලංකා රුපියල් **89,622,500 +PS50M** ) රුපියල් මිලියන **149.63** ක් දක්වා වැඩි කර තිබුණි. උපදේශන ආයතනය විසින් අවසන් ශක්‍යතා වාර්තාව **2020** ජූලි **24** දින ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණද මේ දක්වා එම වාර්තාවට අදාල කාර්යයන් ආරම්භ කර නොතිබුණි. | එකගවේ. | ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කල යුතු බව. |
| (ණ) | තවද එම ව්‍යාපෘතිය යටතේ දුම්රිය ප්ලාසා ඉදිකිරීම සහ සිංහ කණුව වටරවුම ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාතුව 2020 ජූලි 06 වන දින රුපියල් මිලියන 122.62 ක වටිනාකමකට ලබාදී තිබූ අතර එය 2021 ජූලි 21 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. කොන්ත්‍රාත් කාලය 2022 මාර්තු 14 දක්වා දින 310 කින් 3 වතාවකදී දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දරන ලද මුළු වියදම රුපියල් මිලියන 23.79 ක් වූ නමුත් එම දිනය වන විට භෞතික ප්‍රගතිය සියයට 10 ක් පමණක් විය. | එකඟ වේ. රටේ පවතින තත්ත්වය හේතුවෙනි. | කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතු බව. |

**3.2 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සීමාසහිත රියල් එස්ටේට් එක්ස්චේන්ජ් (පුද්ගලික) සමාගම පවරා ගැනීමේදී සිදුව තිබුණු මූල්‍ය වංචාවට අදාලව නීතිපති විසින් **2021** ඔක්තෝබර් **28** දින ලබාදුන් උපදෙස් අනුව අලාභය සම්බන්ධව අදාල පුද්ගලයින්ට එරෙහිව නඩු කටයුතු පැවරිය හැකිද යන්න සලකා බැලීම සඳහා මුදල් රෙගුලාසි **103**(පරිච්ඡේද **11**) යටතේ අදාල රේඛීය අමාත්‍යාංශය විසින් පියවර ගතයුතු බව සඳහන් වුවද එම අධිකාරිය අයත් රේඛීය අමාත්‍යාංශය වන නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් ඒ පිලිබඳව **2022** ජුනි වනවිටත් පියවර ගෙන නොතිබුණි. | පිලිතුරු ලබාදී නැත | රේඛීය අමාත්‍යාංශයේ මැදිහත්වීම මත මෙය නිරාකරණය කිරීමට කටයුතු කල යුතු බව. |